රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - **2019/2020** අධ්‍යයන වර්ෂය

**පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2020 සැප්තැම්බර්**

# MAE 5101 - සාර්ව ආර්ථික න්‍යාය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක් කොටසකින් ප්‍රශ්න දෙක **(02)** බැගින් තෝරාගෙන ප්‍රශ්න <u>**හතරකට (04)**</u> පමණක් පිළිතුරු සපයන්න.
ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

කාලය : පැය 03 යි.

---

## <u>I කොටස</u>

1) එක්තරා කල්පිත විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන් කිහිපයක වටිනාකම් පහත පරිදි ඇස්තමේන්තු වී ඇතැයි සිතන්න. ඒවා උපයෝගී කොටගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (Y = ආදායම සහ i = පොළී අනුපාතිකය වන අතර සියළු ස්වායත්ත සංඛ්‍යා රු. බිලියන වලිනි).

| | | |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | C | $= 100 + 0.80(Yd)$ |
| රජයේ බදු අයභාරය | Tn | $= 50$ |
| රජයේ වියදම් | G | $=100$ |
| පෞද්ගලික ආයෝජන වියදම් | I | $= 140-12i$ |
| ශුද්ධ අපනයන | Xn | $= 10 - 0.2Y$ |
| මුදලට ඇති ඉල්ලුම | L | $=0.20Y - 5i$ |
| මුදල් සැපයුම | M | $=100$ |

i. මෙම ආර්ථිකය සඳහා වන IS සහ LM සමීකරණ ගොඩනගන්න.

(ලකුණු 04)

ii. සාර්ව සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 04)

iii. ඉහත සපයා ඇති තොරතුරු ශ්‍රී ලංකා ආර්ථිකය හා සම්බන්ධිත ඒවා යැයි සිතන්න. කෝවිඩ්-19 සෞඛ්‍ය අර්බුදයට ක්ෂණිකව ප්‍රතිචාර දක්වමින් මෙරට රජය විසින් ආදායම් ආපදාවට ලක් වූ ගෘහස්ථ මිලියන 5.5 කට රුපියල් 5000 බැගින් වූ **සංක්‍රාම දීමනාවක්** 2020 අප්‍රේල් සහ මැයි යන මාස දෙකෙහි ම ලබා දෙන ලදී. ඒ සඳහා වූ මුළු වියදම රුපියල් බිලියන 55 ක් වුණි. අනෙකුත් දෑ ස්ථාවරව පවතීය යන උපකල්පනය යටතේ මෙම ෆිස්කල් ප්‍රතිපත්තියේ කෙටිකාලීන ජාතික ආදායම් සහ ගෘහස්ථ පරිභෝජන ප්‍රතිවිපාක ගණනය කිරීම් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

2) පහත සපයා ඇති උපුටනයන්ගෙන් විස්තර වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 මුල් භාගය තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇති මූල්‍ය ප්‍රතිපත්තියේ දිශානතියයි. එම එක් එක් ප්‍රතිපත්තියක කෙටිකාලීන ආර්ථික ප්‍රතිවිපාක සහ අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමට කළ යුතු වෙනත් ගැලපීම් ISLM ආකෘතියේ ප්‍රස්තාරික නිරූපනය යොදාගනිමින් සාකච්ඡා කරන්න. (සංඛ්‍යා යෙදීම අවශ්‍ය නොවේ).

i. බාහිර වශයෙන් ගෝලීය ආර්ථිකයේත් අභ්‍යන්තර වශයෙන් දේශීය ආර්ථිකයේ සහ මූල්‍ය වෙළෙඳපොළයන්හිත් පවත්නා සහ අපේක්ෂිත සංවර්ධනයන් ගැඹුරින් විශ්ලේෂණය කොට 2020 ජනවාරි 29 දින පැවැති ශ්‍රී ලංකා මධ්‍යම බැංකුවේ මුදල් මණ්ඩල රැස්වීමේ දී මෙරට බැංකු ණය පොළී අනුපාතිකය 10% සිට ජූලි අගවන විට 7.5% දක්වා පහත හෙළීමට තීරණය කරන ලදී. (Source: TRADINGECONOMICS.COM, CBSL)

(ලකුණු 08)

ii. වර්ෂ 2020 අගෝස්තු 26 වැනි දින පැවති වෙන්දේසියේ දී රුපියල් මිලියන 40,000 ක වටිනාකම ඇති භාණ්ඩාගාර බිල්පත් රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මධ්‍යම බැංකුව විසින් විකුණන ලදී. (Press Release, 26 August, 2020, CBSL)

(ලකුණු 0

3) පහත සඳහන් ඒවායින් ඕනෑම **දෙකක් (2)** පිළිබඳව විග්‍රහාත්මක සටහන් ලියන්න.

i. සේවා නියුක්තිය හා ආදායම තීරණයවීම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය

ii. රජයේ වියදම ඉහළයාම හා බැඳී පවතින තෙරපුම් ප්‍රතිවිපාකය (Crowding out effect o Government Expenditure)

iii. මුන්ඩෙල්-ෆ්ලෙමින් ආකෘතිය

iv. ව්‍යාපාර චක්‍ර (The Business Cycle) පිළිබඳ කේන්සියානු න්‍යාය

## II කොටස

4) (i) කේන්සියානු ද්‍රවශීලතා වර්ණ න්‍යාය (Liquidity Preference Theory) පදනම් වන චේතනා තුන (Three Motives) සාකච්ඡා කරන්න.

(ලකුණු 03)

(ii) මුදල් නිර්වචනය කිරීම සම්බන්ධ විවිධ ප්‍රවේශ මොනවා ද? මුදල් නිර්වචනය පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශය (Traditional Approach) සහ චිකාගෝ ප්‍රවේශය (Chicago Approach) අතර ප්‍රධාන වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(iii) යම් කල්පිත ආර්ථිකයක මුදල් සැපයුමට අදාළ වන දත්ත පහත වගුව මඟින් නිරූපණය කෙරේ. (සියලුම දත්ත රුපියල් මිලියන වලිනි.)

| අයිතමය | වටිනාකම (2019 අවසානයට) |
|---|---|
| • සමස්ත ව්‍යවහාර මුදල් | 1550 |
| • මහජනතාව වෙතැති ව්‍යවහාර මුදල් | 1200 |
| • මහබැංකුව වෙතැති වාණිජ බැංකුවල තැන්පතු | 750 |
| • මහබැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු | 50 |
| • වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 1000 |
| • පුළුල් මුදල් සැපයුම ($M_2$) | 7450 |
| • ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 9250 |

(අ) වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල්, සංචිත මුදල් සහ වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතුවල වටිනාකම ගණනය කරන්න.

(ලකුණු 02)

(ආ) 2019 වර්ෂය සඳහා පටු මුදල් සැපයුම ($M_1$) ඇස්තමේන්තු කරන්න.

(ලකුණු 01)

(ඉ) ඉහත දත්ත භාවිතා කරමින් 2019 වර්ෂය සඳහා ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම් ගුණකය ($M_2b$) නිශ්චය කරන්න.

(ලකුණු 01)

(ඊ) ගලපන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල වටිනාකම ඇස්තමේන්තු කොට ශ්‍රී ලංකාව වැනි රටක වඩාත් පුළුල් මුදල් සැපයුම ($M_4$) ඇස්තමේන්තු කිරීම සඳහා අවශ්‍ය කරන අතිරේක දත්ත හඳුනාගන්න.

(ලකුණු 02)

(IV) මුල්‍ය ප්‍රතිපත්තිය (Monetary Policy) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න විස්තර කරන්න.

(ලකුණු 03)

5) (i) සමාහාර ඉල්ලුම් සහ සමාහාර සැපයුම් ආකෘතිය යොදා ගනිමින් ඔබ විසින් පිලිප්ස් වක්‍රය ව්‍යුත්පන්න කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(ii) (අ) 1970 ගණන්වල සහ 1980 ගණන්වල මුල්භාගය තුළ කෙටිකාලීන පිලිප්ස් වක්‍රය (Short - run Phillips Curve) බිඳවැටීමට හේතු වූ සාධක කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 03)

(ආ) බලශක්ති මිල ගණන්වල පහත වැටීමක් පිලිප්ස් වක්‍රයට බලපානු ලබන්නේ කෙසේ ද?

(ලකුණු 02)

(iii) "නවලන්ත (Newland)" ආර්ථිකයේ ස්වාභාවික සේවා වියුක්ත අනුපාතය (Natural rate of Unemployment) 8% ක් බව උපකල්පනය කරන්න. එම ආර්ථිකයේ දැනට පවතින සේවා වියුක්ත අනුපාතිකය සහ උද්ධමන අනුපාතිකය පිළිවෙළින් 6% සහ 7% වේ.

දෙන ලද සේවා වියුක්ත සහ උද්ධමන අනුපාතිකය ආශ්‍රයෙන් නිවැරදි ව අඳින ලද පිලිප්ස් වක්‍රයක් භාවිතා කරමින් නවලන්ත ආර්ථිකයට අදාළ ව වර්තමාන තත්ත්වය රූපසටහනක් මඟින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 02)

(iv) "ෆ්‍රිඩ්මන්ට අනුව දිගුකාලීන පිලිප්ස් වක්‍රය (Long - run Philips curve) ස්වාභාවික සේවා වියුක්ත අනුපාතිකයේ දී සිරස් ව පිහිටයි. එම නිසා දිගුකාලයේ දී උද්ධමන අනුපාතිකය හා සේවා වියුක්ත අනුපාතිකය අතර ගැටුමක් (trade - off) නොපවතී."

අනුවර්තීය අපේක්ෂණ න්‍යාය (Theory of adaptive expectations) භාවිතා කරමින් ඉහත ප්‍රකාශය පිළිබඳ ව ඔබගේ මතය ප්‍රකාශ කරන්න.

(ලකුණු 05)

6) (i) යම් ආර්ථිකයක ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය (Demand - pull inflation) සඳහා වඩාත්ම දායක වන සාධක මොනවා ද?

(ලකුණු 03)

(ii) මිල අවධමනයට (Price deflation) යන පදය අර්ථ දක්වා යම් ආර්ථිකයක් විෂයයෙහි මිල උද්ධමනයක ප්‍රතිවිපාක (Consequences) අගයන්න.

(ලකුණු 03)

(iii) ප්‍රමාණවත් තොරතුරු සහ ප්‍රස්තාර භාවිතා කොට පහත සංකල්ප විස්තර කරන්න.

(අ) කේන්සියානු පොලී අනුපාත න්‍යාය සහ මුදල් වෙළෙඳපොළ සමතුලිතය (The Keynesian theory of interest and money market equilibrium)

(ආ) ද්‍රවශීලතා පාශය (The Liquidity trap)

(ඉ) අවපානෝද්ධමනය (The Stagflation)

(ලකුණු 09

@@@@@@@@@